# Sri Lak Laboratory Services (Pvt) Ltd හි ජල පරීක්ෂා ගාස්තු

## ජල පරීක්ෂා

Sri Lak Laboratory Services (Pvt) Ltd අඩුම ගාස්තුවක් අයකරමින් ජල තත්ත්ව පරීක්ෂා සිදුකරණ රසායනාගාරයකි. ගාස්තු පමණක් නොව ඉතාම අඩු කාලයක් තුල පරීක්ෂණ වාර්තා අපි ලබාදෙමු.

භූගෝලීය කලාප සහ සාමාන්‍ය ජල ගුණත්වයන් පිළිබඳව ගැඹුරින් සලකා පැකේජයන් අපවිසින් හඳුනාගෙන ඇත. එම සෑම පැකේජයක්ම අදාල භූගෝලීය කලාපයේ ජල මූලාශ්‍රවල සාමාන්‍ය ජනතාව මුහුණ දෙන පොදු ජල තත්ත්ව ගැටළු ආවරණය කරයි. සෑම පරීක්ෂණ පැකේජයක්ම අත්‍යවශ්‍ය පරීක්ෂණ ඇතුලත්ව සංවිධානය කර ඇත. අපගේ සේවාදායකයා හට තවත් පරාමිතීන් පරීක්ෂා කරගැනීමට අවශ්‍යවේනම් ඒ සඳහා සේවාදායකයා තවදුරටත් දැනුවත් කරමින් එම අතිරේක පරීක්ෂා සංවිධානය කර දෙනු ඇත.

ඔබට අවශ්‍ය පරාමිතීන් ඔබටම තෝරාගැනීමට හෝ අපගේ රසංඥවරයෙක් සමඟ සාකච්ජා කර අවශ්‍ය පරීක්ෂා පැකේජය ඔබට තොරගතහැකිය. පරීක්ෂා කරණු ලබන පරාමිතීන් අනුව පරික්ෂා පැකේජ රුපියල් 1,000.00 සහ රුපියල් 4,450.00 අතර පරාසයක වේ. විශේෂ අවස්ථාවලදී සේවාදායකයාගේ ජල තත්ත්ව ගැටළු විමසා අවශ්‍ය පරාමිතීන් තෝරාගැනීමට අපගේ රසංඥවරුන්ගේ සහය ලබාගත හැකිය.

පරීක්ෂා වාර්තාව සේවාදායකයා වෙත ප්‍රවාහණය කිරීමට අපේක්ෂා කරන්නේනම් අතිරේක රුපියල් 300.00 ගෙවීමෙන් ජල නියැදිය රසායනාගාරයට භාරදීමෙන් පසු තුන්වන දිනයේ වාර්තාව එක්දින ප්‍රවාහනය සඳහා භාරදෙනු ලැබේ.

Sri Lak Laboratory Services (Pvt) ltd ප්‍රතීතන ක්‍රියාවලියට අනුගත පානීය ජලය සහ ක්‍රියාවලියන්හි අතවශ්‍ය ජලය පරීක්ෂාකරණ රසායනාගාරයකි. පරීක්ෂා සිදුකිරීම සහ වාර්තා නිකුත්කිරීම ප්‍රතීත රසායනාගාරයක් ලෙස ISO 17025: 2005 ප්‍රමිතියට අනුකූල වේ. ( ප්‍රතීතන සහතිකය සහ විෂය පථය බැලිය හැකිය.) පරීක්ෂා වාර්තාවට අමතරව ක්ෂේත්‍රයේ වඩාත්ම පළපුරුදු රසංඥවරයා හමුවී ඔබගේ පරීක්ෂා වාර්තාව පිළිබඳව සහ එහි ගැටළු පිළිබඳව දැනුම්වත් විය හැකිය.

## නියැදියක් පරීක්ෂාකිරීම සඳහා මිලගණන් ලබන්නේ කෙසේද?

(1) මීගමුව අවට සාමාන්‍ය ජනතාව රසායනාගාරය වෙත පැමිණ අවශ්‍ය පරීක්ෂා පැකේජය තීරණය කර නිවැරදි ක්‍රමවේදය අනුව ජල නියැදි ලබාගැනීමට අවශ්‍ය බෝතල් කට්ටලය සහ ජල නියැදි ලබාගන්නා නිවැරදි ක්‍රමවේදය ලිඛිතව ලබාගත හැකිය. සේවාදායකයා දුරබැහැර වේනම් ජල නියැදි ලබාගැනීමට අවශ්‍ය බෝතල් කට්ටලය සහ ජල නියැදි ලබාගන්නා නිවැරදි ක්‍රමවේදය බැංකු ගිණුමට මුදල් බැරකර අපවෙත දැන්වූ වහාම එක්දින ප්‍රවාහනය සඳහා භාරදෙනු ලැබේ.

(2) ආයතන මට්ටමින් කරණු ලබන විමසීම් ඊ-මේල් ඔස්සේ සිදුකිරීමෙන් මිලගණන් පත් දින 1-2 කාලයක් තුලදී ලබාගත හැකිය. විධිමත් මිලගණන් පිළියෙළ කිරීම සඳහා පහත දැක්වෙන සියළුම තොරතුරු එවීම අවශ්‍ය වේ.

1. ආයතනයේ හෝ සේවාදායකයාගේ නම සහ ලිපිණය;
2. පරීක්ෂා කලයුතු පරාමිතීන්;
3. නියැදි එකතු කරන්නේ සේවාදායකයාද නැතහොත් රසායනාගාරය නියැදි එකතු කලයුතුද යන වග;
4. සම්බන්ධීකරකයාගේ විස්තර, ජංගම දුරකථන අංකය සහිතව;
5. ජල නියැදි එකතු කලයුතු හෝ පරීක්ෂා කලයුතු දිනය දල වශයෙන්;
6. ජල නියැදි පරීක්ෂා කලයුතු පදනම, සාමාන්‍යද හෝ හදිසිද යන බව.
7. පරීක්ෂා වාර්තාව සේවාදායකයා විසින් භාරගන්නවාද නැතහොත් එක්දින ප්‍රවාහනය මගින් ලබගන්නවාද යන බව.